## **මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

## **පුරප්පාඩු**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### **01. පෙදරේරු (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | UPL 3 (III) රු. 48,005 - 16 X 490 – 55,845 (මාසික)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

### **02. විද්‍යාගාර සහයක (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 1. | අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>හෝ |
| | 2. | අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | U-PL-2 (III) - රු. 44,575-16x490-52,415 (මාසික)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**03. ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| සුදුසුකම් | : | අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br><br>*අයදුම්කරු විසින් මෑතකදී ලබාගත් පොලිස් වාර්තාවක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.* |
| **වැටුප් ක්‍රමය | : | UPL1 (III) රු. 42,775 -16x450 -49,975 (මාසික)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 (i) අනුව අදාල වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණක් මගින් |

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් 2026.08.03 දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත පද්ධතිය හරහා අයදුම්පත් ඉදිපත් කිරිම සඳහා, අයදුම්කරුවන් https://uom.lk/vacancies. වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය. මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය 2026.07.12 දින සිට විවෘත වන අතර 2026.08.03 අවසන් වේ.

සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ එක් එක් තනතුරු සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත භාගත කර එම දෘඪ පිටපත (Hard Copy) තමා විසින් සහතික කරන ලද හා සියලුම ඇමුණුම් සමඟ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) අංශය, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.03 දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් ඉහත පරිදි බාගත කරන තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ දෙපාතර්මේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

අපේක්ෂකයින් කෙටි ලයිස්තුගත කිරිමේ (Shortlist) අයිතිය මොරටුව විශ්වවිද්‍යාලය සතුය. අවශ්‍ය අයදුම්පත් මාර්ගගත ක්‍රමය මගින් යොමු කිරිමේ දී තාක්ෂණික ගැටළු ඇතිවුවහොත් 011- 2640511 දුරකථන අංකය අමතන්න.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව
2026.07.10